# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2141/20 – 2019 සැප්තැම්බර් මස 18 වැනි බදාදා – 2019.09.18**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ, කුණ්ඩසාලේ හාරගම ජල සම්පාදන ව්‍යාපෘතියේ, පිච්චමල් වත්ත සේවා ජලාශයේ ප්‍රවේශ මාර්ගය හා නල එලීම සඳහා විකල්ප ඉඩම් කොටස් හි පරවශතා අයිතිය අත් කර ගැනීමට අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උප ලේඛනයෙහි දක්වෙන ඉඩම් කොටස් වල පරවශ්‍යතා අයිතිය අත් කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

**රවුෆ් හකීම්,**
නගර සැලසුම්, ජල සම්පාදන සහ
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2019 සැප්තැම්බර් මස 09 වැනි දින,
නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය,
අංක 35, ''ලක්දිය මැදුර'',
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.
5/2/1/1500

1A – G 30998 – 50 (2019/09)

*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර කඩවත් සතර හා ගඟවට කෝරලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 278, ගුරුදෙණිය බටහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, කිරිමැටිය ගමේ පිහිටි, බලයලත් මිනින්දෝරු ජේ. පී. කේ. වීරකෝන් මහත්මිය විසින් මැන සකස් කරන ලද අංක 0394 - BS දරන මිනින්දෝරු සැලැස්මේ කැබලි අංක 96 සහ 219 වශයෙන් දැක්වෙන ''වෙට්ටිගේ වත්ත'' නැමැති ඉඩමෙන් මුළු ප්‍රමාණයෙන් පර්චස් 30.1 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස් දෙක,

*කැබලි අංක* : 96
*ඉඩමේ ප්‍රමාණය* : පර්චස් 19.8
*මායිම්*

*උතුරට* : අංක 0394 - BS දරන පිඹුරේ කැබලි අංක 224, 225, 226, 227, 92 සහ 219;
*නැගෙනහිරට* : අම්පිටිය සිට ගුරුදෙණිය දක්වා වැටී ඇති මාර්ගය (ප්‍රාදේශීය සභා) සහ අංක 0394 - BS දරන මෙම පිඹුරේ කැබලි අංක 220 සහ 227;
*දකුණට* : අම්පිටිය සිට ගුරුදෙණිය දක්වා වැටී ඇති මාර්ගය (ප්‍රාදේශීය සභා) සහ අංක 0158 - BS දරන බලය ලත් මිනින්දෝරු සැලැස්මේ කැබලි අංක 97 සහ එම සැලැස්මේ කැබලි අංක 95;
*බටහිරට* : අංක 0158 - BS දරන බලයලත් මිනින්දෝරු සැලැස්මේ කැබලි අංක 92, 93, 94 සහ 95.

*කැබලි අංක* : 219
*ඉඩමේ ප්‍රමාණය* : පර්චස් 10.3
*මායිම්*

*උතුරට* : අංක 0394 - BS දරන මෙම පිඹුරේ කැබලි අංක 214, 218, 216 සහ 217;
*නැගෙනහිරට* : අංක 0394 - BS දරන මෙම පිඹුරේ කැබලි අංක 215, 217 සහ 222;
*දකුණට* : අංක 0394 - BS දරන මෙම පිඹුරේ කැබලි අංක 96, 220 සහ 221;
*බටහිරට* : අංක 0394 - BS දරන මෙම පිඹුරේ කැබලි අංක 214 සහ කැබලි අංක 218.

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* :

01. ඩබ්. ඒ. රංජිත් උපේන්ද්‍ර සිල්වා මහතා,
අංක 160/5, කුමුදු මාවත,
ශ්‍රී සෝමරතන මාවත,
බෙල්ලන්විල,
බොරලැස්ගමුව.

10-70

---

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ, මහනුවර උතුර - පාතදුම්බර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියේ, ගිරාකඩුව පොම්පාගාරයේ ප්‍රවේශ මාර්ගය හා නල එලීම සඳහා අතිරේක ඉඩම් කොටසක පරවශතා අයිතිය අත් කර ගැනීමට අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උප ලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටස් වල පරවශතා අයිතිය අත් කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

**රවුෆ් හකීම්,**
නගර සැලසුම්, ජල සම්පාදන සහ
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2019 සැප්තැම්බර් මස 09 වැනි දින,
නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය,
අංක 35, ''ලක්දිය මැදුර'',
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.
5/2/1/1502

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 631, ගිරාකඩුව, ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ගිරාකඩුව ගමේ පිහිටි, ''හපුගස්පිටිය වත්ත'' නැමැති ඉඩමෙන් පහත සඳහන් මායිම් තුළ පිහිටි පර්චස් 07 ක් පමණ වන ඉඩම් කොටස:

*ඉඩමේ නම* : හපුගස්පිටිය වත්ත
*ප්‍රමාණය* : පර්චස් 07
මායිම්

*උතුරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස;
*නැගෙනහිරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස;
*දකුණට* : මෙම ඉඩමේ ඉතිරි කොටස කුඹුර;
*බටහිරට* : කුඩුගල - වත්තේගම පාර

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය :*

01. එන්. එච්. එම්. ඩබ්. ඒ. ඩී. බී. ඒකනායක මහතා,
හපුගස්පිටිය,
ගිරාකඩුව,
ජම්බුගහපිටිය.

10-71

---

### ශුද්ධි පත්‍රය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, 2019.02.28 දිනැති අංක 2112/39 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ 2 A පිටුවේ අංක 03-771 යටතේ පළ කරන ලද නිවේදනයේ උප ලේඛනයෙහි අත් කර ගන්නා ඉඩම් කොටස දැක්වෙන ''අංක 4490 A දරන පිඹුරේ කැබලි අංක 1'' වශයෙන් සඳහන් වුවත්, එය කැබලි අංක 1 න් කොටසක්'' ලෙස සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශයට පත් කරමි.

**රවුෆ් හකීම්,**
නගර සැලසුම්, ජල සම්පාදන සහ
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2019 සැප්තැම්බර් මස 09 වැනි දින,
නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය,
අංක 35, ''ලක්දිය මැදුර'',
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.
5/2/1/1429.

10-72

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.